SRI LANKA ACCREDITATION BOARD

# අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

# කණිෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ නිලධාරී) තනතුර සඳහා පුරප්පාඩු - තනතුරු 01

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 2005 අංක 32 දරන පනත යටතේ ස්ථාපිත කොට ඇති අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීම සඳහා වන අධිකාරී බලය සතු ශ්‍රී ලංකාවේ එකම ආයතනයයි.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කණිෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ නිලධාරී) II ශ්‍රේණිය

**සුදුසුකම් :**

**බාහිර :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හා රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක් තුළ තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් වසර 01 ක පශ්චාත් සේවා පළපුරුද්දක්

හෝ

තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙහි NVQ මට්ටම 7 ට වඩා අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසර 01 ක පශ්චාත් සේවා පළපුරුද්දක්

හෝ

තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙහි NVQ මට්ටම 6 ට වඩා අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් වසර පහක පශ්චාත් සේවා පළපුරුද්දක්

හෝ

තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙහි NVQ මට්ටම 5 ට වඩා අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පශ්චාත් සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

අයදුම්කරුවන් වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය : JM 1-1 - 2016 : Rs. 42,600 - 10 x 755 - 18 x 1,135 – 70,580**

**සටහන :** 2020-01-01 වන තුරු සියලු බඳවාගැනීම් හා උසස්වීම් සඳහා ගෙවීම් සිදු කිරීම. ඩී.එම්.එස්. චක්‍රලේඛ අංක 02/2016 හි II උපලේඛනය පරිදි සිදු කෙරේ.

ඒ අනුව 2019 වසර සඳහා රු. 38,185/= මූලික වැටුපක් ගෙවනු ලැබේ. මීට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

අනෙකුත් ප්‍රතිලාභ අතරට සේ.අ.අ. සඳහා 15% ක් ද සේ.භා.අ. සඳහා 03% ක ප්‍රතිපාදනයක්ද අයත් වේ.

**බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය :** විවෘත ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් තුළින්

**තහවුරු කිරීම :** බඳවා ගන්නා අයදුම්කරුවන් වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. මේ කාලය අවසාන වනවිට ඔහු/ඇය ගේ කාර්ය සාධනය හා හැසිරීම සතුටුදායක මට්ටමක ඇත්නම්, ඔවුන්ගේ සේවය ස්ථිර කරනු ලැබේ.

ජීව දත්ත ලේඛනය හා සහතිකවල ඡායා පිටපත් සමග අයදුම්පත් ලියුම් කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නි, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, නො. 104/A කිතුල්වත්ත පාර, බොරැල්ල** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. රජයේ හෝ අර්ධ රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් තම අයදුම්පත් අදාල ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2019 පෙබරවාරි 25 වෙනි දින.**

අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නි.

**ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**